# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ)

**රජිත කොඩිතුවක්කු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මලිත් ජයතිලක මහතා විසින්
2016 සැප්තැම්බර් මස 23 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජුනි මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[139 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## රජිත කොඩිතුවක්කු පදනම
## (සංස්ථාගත කිරීමේ)

### රජිත කොඩිතුවක්කු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

''රජිත කොඩිතුවක්කු පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2016 අංක දරන රජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*රජිත කොඩිතුවක්කු පදනම සංස්ථාගත කිරීම.*

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) රජිත කොඩිතුවක්කු පදනමේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''රජිත කොඩිතුවක්කු පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) රටේ සමාජයීය. සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය උපදෙස් සහ ආධාර ලබා දීම;

(ඇ) නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) ආධාර ලැබීමට සුදුසු ළමුන්ට ස්වකීය අධ්‍යාපනය දිගටම පවත්වාගෙන යාමට හැකි වන පරිදි මූල්‍යමය හෝ අන්‍යාකාරයකින් පරිත්‍යාග, ත්‍යාග සහ ශිෂ්‍යත්ව ලබා දීම, නොකඩවා පාසලට පැමිණීමට දිරිගැන්වීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, සංස්කෘතික හා විද්‍යාත්මක කටයුතු දියුණු කර ගැනීමට සහාය වීම;

(ඉ) ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන් අතර මානව හිමිකම්, මිනිස් සාරධර්ම සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ප්‍රවර්ධනය කිරීම;

(ඊ) විවිධ ජන වර්ග සහ ප්‍රජාවන් අතර එකමුතුකම ප්‍රවර්ධනය කිරීම සහ නගාසිටුවීමේ අරමුණ ඇතිව සමාජ සහ සංස්කෘතික කටයුතුවලට සහභාගී වීම සඳහා ඔවුන් දිරිගැන්වීම;

(උ) ශ්‍රී ලංකාවේ සියළු ප්‍රජාවන් අතර ඔවුන්ගේ ජීවිතවල තත්ත්වය නගා සිටුවීම සඳහා මානුෂීය කටයුතු, ක්‍රීඩා, සාහිත්‍ය, අධ්‍යාත්මික ක්‍රියාකරකම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා දිරිගැන්වීම;

(ඌ) අදාළ ආයතනවල එකඟත්වය ඇතිව අදාළ ආයතන සමග පහත සඳහන් කාරණාවලදී සහාය වීම:—

(i) පුස්තකාල පවත්වාගෙන යාම;

(ii) නවීන තාක්ෂණය භාවිතා කරමින් කෘෂිකාර්මික හා ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම;

(iii) විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම;

(iv) උසස් අධ්‍යාපන ආයතන වැඩිදියුණු කිරීමට සහාය වීම සහ අවශ්‍යතා ඇති සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා දීම මෙන්ම පර්යේෂණ කටයුතු සඳහා උනන්දු කරවීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම; සහ

(v) ආබාධ සහිත තැනැත්තන්, දිළිඳු තැනැත්තන් ඇතුළු සමාජයෙන් කොන් වී සිටින පිරිස් සහ කාන්තාවන් හා ළමයින් ස්වකීය හැකියාවන් මුදුන්පත් කර ගැනීම සඳහා බලවත් කිරීම; සහ

(vi) අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික සෞන්දර්යය සහ ක්‍රීඩා පහසුකම් සංවර්ධනය කිරීම සහ විවිධ උත්සව සහ තරග සංවිධානය කිරීම.

පදනමේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව පදනමේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන පදනමේ රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය"යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හෝ දැරීම, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි හෝ ව්‍යුහයන් ඉදිකිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක්

ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කළ යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කරගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන් සහ සේවකයන් පත්කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සාමාජිකයකු වීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීමට සපුරාලිය යුතු සුදුසුකම්;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත්කර ගැනීම; සහ

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.**

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල, ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව පදනමට නීතියෙහි ලා හැකියාව සහ බලය ඇති අතර, එවැනි සියළු දේපළ විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ පදනම විසින් දැරිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දයක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර,

සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කර ගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් ලියා අත්සන් කළ යුතු අතර. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.